**මිනිපේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 අවිනිශ්චිත ගිණුම

වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙන එමින් තිබුණු රු.13,369 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.38,232,720 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.20,013,513 විය.

#### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 06 ක එකතු වටිනාකම රු.39,087,222 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.16,618,586 ක් විය.

#### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 02 කට අදාල අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.64,386,592 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,064,413 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,784,629 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,720,216ක අඩුවීමක් දක්නට ලැබුණි. 2015 වර්ෂයේ දී සේවා සඳහා ගාස්තු ආදායම රු.9,977,385 ක් අඩුවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | 2015.01.01 ට හිඟය | වර්ෂයේ බිල්කළ ආදායම | එකතු කළ ආදායම | | 2015.12.31 දිනට මුළු අය කළ යුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | 2015.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල්කල ආදායමෙන් එකතු කල ආදායම | |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 530,184 | 548,053 | 199,060 | 417,508 | 461,669 |
| කුලී ආදායම් | 1,904,910 | 1,051,943 | 246,751 | 354,088 | 2,356,014 |
| ජල ගාස්තු | 2,153,106 | 2,680,769 | 1,107,020 | 1,532,971 | 2,193,884 |
| සේවා සඳහා ගාස්තු | 3,400,148 | - | 956,558 | - | 2,443,590 |
| එකතුව | | | | | 7,455,157 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු7,455,157 ක මුළු ආදායමක් හිඟ හිට තිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.530,184 ක හිඟ ශේෂයක් පැවති අතර, ඉන් රු.199,060 ක් හෙවත්, සියයට 37 ක් අය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ රු.548,053 ක මුදලින් රු.417,508 ක් අය කර ගෙන තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 76 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට රු.461,669 ක ශේෂයක් විය.

### 2.2.3 බදු කුලී

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු.1,051,943 ක් වූ අතර, ඉන් වර්ෂය තුළ අය කිරීම් රු.354,088 ක් වූ සියයට 33 ක් තරම් අඩු අගයයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට හිග ශේෂය රු.2,356,014 ක් වූ අතර, මෙම හිග ශේෂය තුළ හසළක නගරයේ ඉදි කර ඇති කඩ කාමර 20 කින් අය වියයුතු රු.1,764,615 ක් ද ඇතුළත් වී තිබුණි.

(ආ) කඩ කාමර සඳහා වර්ෂ 05 කට වරක් තක්සේරු වාර්තා ලබා ගෙන ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කඩ කාමර 24 කින් රු.2,281,729 ක හිග කඩ කාමර කුළී දිගු කාලයක සිට අය වියයුතුව තිබුණි.

### 2.2.4 පරිසර බලපත්‍ර.

---------------

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ (ඇ) කොටසේ විධිවිධාන ප්‍රකාර බලපත්‍ර කාලය ඉකුත්ව තිබූ වී ඇඹරුම්හල් 13 ක බලපත්‍ර අලුත් කිරිමට කටයුතු කර නොතිබූ අතර, කර්මාන්ත 03 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දී නොතිබුණි.

### 2.2.5 ජල ගාස්තු

------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,153,106 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.2,680,769 ක් විය. හිගයෙන් අය කිරීම් රු.1,107,020 ක් හා වර්ෂයේ බිල් කිරීම්වලින් අය කිරීම් රු.1,532,972 ක් විය. වර්ෂය අවසානයේ රු.2,193,884 ක හිග ශේෂයක් පැවතිණි. මේ අනුව, ජල ගාස්තු අය කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) සභාවේ ජල යෝජනා ක්‍රමවලින් ජලය භාවිතා කරනු ලබන ජල පාරිභෝගිකයින් 1475 දෙනෙකු අතරින් 1047 ක් සඳහා ජල මනු සවි කර නොතිබුණි. ජල මනු සවි නොකිරීම හේතුවෙන්, ජල පරිභෝජනයේ සීමාවන් නොමැති විම නිසා, සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දින වන විට රු.5,000 ට වැඩි හිග ශේෂයක් පැවති ජල පාරිභෝගිකයින් 20 කගෙන් එකතුව රු.247,447 ක් අය වියයුතුව තිබූ අතර, මෙම හිග මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 විනෝද බදු**

---------------

මිනිපේ රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ සුභ සාධක සංගමය විසින් 2015 සැප්තැම්බර් 30 දින හසළක පොදු ක්‍රීඩාංගණයේ පවත්වන ලද සංගීත සංදර්ශනයකින් විනෝද බදු ලෙස අය වියයුතු රු.12,990 ක් 2016 ජුනි 20 දින වන විටත් අය කර ගෙන නොතිබූ අතර, සංගීත සංදර්ශනය වෙනුවෙන් ලබා ගෙන තිබුණු රු.20,000 ක තැන්පත් මුදල පොදු තැන්පත් ගිණුමේ රදවා ගෙන තිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.494,884 ක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.639,050 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 සේවක මණ්ඩල කළමනාකරණය.**

---------------------------------------

(අ) සභාවේ අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරුවල 15 ක ඌනතාවයක් හා 03 ක ගේ අතිරික්තයක් නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත කරුණු ද නිරීක්ෂණය කෙරේ.

(අ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව අනියම් සේවකයින් 04 දෙනෙකු බදවා ගෙන තිබුණි.

(ආ) සුළු සේවකයින් 04 දෙනෙකුට කාර්යාලයේ කළමනාකරණ සහකාර රාජකාරී පවරා තිබුණි.

(ඇ) කාර්යක්ෂමතා කඩ ඉම් විභාග පවත්වා නොතිබීම නිසා, සභා නිලධාරීන් හා සේවකයින් 05 දෙනෙකුට වැටුප් වර්ධක ලබා දීමට නොහැකි වී තිබුණි.

**3.2 අනුකූලතා සහතික නිකුත් කිරීම.**

--------------------------------

ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සම්බන්ධව සභාව වැඩි අවධානයක් යොමු කර නොතිබූ අතර, පසු ගිය වර්ෂ 03 ක හා සමාලෝචිත වර්ෂයේ එකතුව ලෙස ගොඩනැගිලි සැළසුම් 46 ක් අනුමත කර තිබුණි. ඒ අතරින් සමාලෝචිත වර්ෂයේ අනුමත ගොඩනැගිලි සැළසුම් 05 කට පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

**3.3 අනවසර ඉදි කිරීම්.**

--------------------

සභා බල ප්‍රදේශය තුළ ඉදි කරනු ලබන අනවසර ඉදි කිරීම් සම්බන්ධ සොයා බලා ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 වෙනත් ආයතනවලින් ලැබුණු වාහන.

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබී තිබුණු වාහන 04 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව2015 පෙබරවාරි සිට 2016 මැයි දක්වා මාස ගණනාවක සිට සභාවේ භාවිතා කරන වාහන 05 ක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.6 අංක 252 – 6504 දරන කැබ් රථය නඩු භාණ්ඩයක් ලෙස උසාවි භාරයට ගැනීම.

1997 වර්ෂයේ හසළක සති පොළ භූමිය සංවර්ධනය කිරීමේ දී පුද්ගලික නිවසක අත්තිවාරමක් එවකට සිටි සභාපතිවරයා විසින් අත්තනෝමතිකව කඩා ඉවත් කිරීම නිසා, එහි අලාභය වූ රු.24,709, ක මුදල නොගෙවීම හේතුවෙන්, අගතියට පත් පාර්ශවය විසින් හිටපු සභාපතිවරයාට හා ප්‍රාදේශීය සභාවට එරෙහිව මහනුවර දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. අගතියට පත් පාර්ශවයට රු.500,000 ක මුදලක් හා ඊට අදාළ නෛතික පොළියක් ගෙවියයුතු බවට 2005 වර්ෂයේ නඩු තීන්දුවක් ලබා දී තිබූ අතර, එම නඩු තීන්දුවට අනුව මුදල් නොගෙවීම හේතුවෙන්, අදාළ පාර්ශවය විසින් කළ අභියාචනයකට අනුව මුදල් ගෙවීමට නියෝග කර තිබුණි. එසේ වුවත්, හිටපු සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාව මුදල් නොගෙවීම හේතුවෙන්, ප්‍රාදේශීය සභාව සතු අංක 252 – 6504 දරන මිට්සුබිෂි කැබ් රථය නඩු භාණ්ඩයක් ලෙස අධිකරණයේ භාරයට ගෙන තිබුණි. අධිකරණ තීරණය අනුව හිටපු සභාපතිවරයාගෙන් අදාළ මුදල් ලබා නොගෙන සභාවට අයත් කැබ් රථය නඩු භාණ්ඩයක් ලෙස තවදුරටත් අධිකරණය භාරයට පවරා සභා භූමියේ දිරා පත් වීමට ඉඩ හැර තිබුණි. එය අද වන විට භාවිතයට ගැනීමට නොහැකි මට්ටමින් පැවතුණි. මේ සම්බන්ධව 2005 සිට මේ දක්වා සභාවේ කටයුතු කළ වගකිවයුතු පාර්ශවයන් කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබූ අතර, ඒ බව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

#### 3.7.1 හසලක සතිපොළ සංවර්ධනය කිරීම (අදියර I සහ II ) - රු.840,705

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 21 දින කරන ලද භෞතික පරීක්ෂණවේදී පහත කරුණු අණාවරණය විය.

(අ) ඉදි කර තිබූ සති පොළ ගොඩනැගිල්ලේ පොළව කොන්ක්‍රීට් කිරීම සඳහා 1:2½:5 (මි.මී.25) කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් මී.මී. 75 ක් ඝනකමින් කොන්ක්‍රීට් යෙදියයුතු වුවත්, එම කොන්ක්‍රීටය ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී එහි ඝනකම මි.මී. 50 ක් වී තිබුණු අතර, එහි කොන්ක්‍රීට් මිශ්‍රණය ද පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල තත්ත්වයක තිබුණි. මේ සඳහා රු.139,500 ක් ගෙවා තිබුණි.

(ආ) පොළවේ කොන්ක්‍රීටය මත 1:3 සිමෙන්ති වැලි මිශ්‍රණයේ බදාම යෙදිය යුතු වුවත්, ඉතා පහසුවෙන් කැඩිය හැකි දුර්වල බදාම මිශ්‍රණයක් යොදා තිබූ අතර, කොන්ක්‍රීට් පොළවේ ස්ථාන කීපයක් පුපුරා ඉරි තළා තිබුණි. මේ සඳහා රු.58,998 ක් වැය කර තිබුණි.

(ඇ) ගොඩනැගිල්ල සඳහා සැළසුම් පිළියෙළ කර නොතිබුණි.

**3.7.2 සතිපොළ සංවර්ධනය කිරීම - රු.899,500**

**-----------------------------------------------**

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 21 දින කරන ලද භෞතික පරීක්ෂාවෙන් පහත කරුණු අණාවරණය විය.

(අ) කොන්ක්‍රීට් පොළවේ ස්ථාන කීපයක් පුපුරා ඉරි තලා ගොස් තිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් පොළව මත 1:3 සිමෙන්ති වැලි මිශ්‍රණයේ බදාම යොදා නිමාව සකස් කළයුතු වුවත්, ඉතා පහසුවෙන් කැඩිය හැකි දුර්වල බදාම මිශ්‍රණයක් යොදා ගෙන තිබුණි. මේ සඳහා ව.මී. 45 ක් සඳහා රු.33,030 ක් ගෙවා තිබුණි.

(ඇ) ගොඩනැගිල්ල සඳහා සැලසුම් පිළියෙළ කර නොතිබුණි.

**3.7.3 කොම්පෝස්ට් අංගනයේ නාන කාමරය, වැසිකිළිය, පොහොර ගබඩා කාමරය හා කාර්යාල කාමරය ඉදි කිරීම - රු.900,000**

**-----------------------------------------------------------------------------------------------**

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 21 දින කරන ලද භෞතික පරීක්ෂාවෙන් පහත කරුණු අණාවරණය විය.

(අ) වැඩ විෂය අංක 17 යටතේ පළමු පන්තියේ දැව යොදා 95mm x 45mm ප්‍රමාණයේ උළුවහු සවිකර oxidized heavy උපාංග සහිත දොරවල් 04 ක් සවි කිරීම සඳහා 8.18 $m^2$ ක් වෙනුවෙන් රු.110,913 ක් ගෙවා තිබුණි. සියලු දොරවල් ඇද වී දොර ලෑලි ඇත් වී භාවිතා කිරීමට නොහැකි පරිදි දුර්වල තත්ත්වයකින් යුක්ත වූ අතර, යොදා ඇති දොර අගුළු හා උපාංග උසස් වර්ගයේ නොවූ බවත් නිරීක්ෂණය විය.

(ආ) වැඩ විෂය අංක 17 යටතේ පළමු පන්තියේ දැවයෙන් 4"x3" ප්‍රමාණයෙන් ජනෙල් රාමු සකස් කිරීම සඳහා 5.83 $m^3$ක් වෙනුවෙන් රු.94,574 ක් ගෙවා තිබුණි. එසේ වුවත්, 3½"x2½" ප්‍රමාණයේ දැව භාවිතා කර තිබූ අතර, සවි කර තිබූ උපාංග හා යොදා ජනෙල් උසස් තත්වයේ නොතිබුණි.

**3.7.5 ගුරුළුපොත සංචාරක ආකර්ශනය ඇති වන ආකාරයෙන් සංවර්ධනය කිරීම යටතේ ගිමන් හලක් ඉදිකිරීම - රු.617,837**

**------------------------------------------------------------------------------------------------------**

(අ) ගෙවීම් බිල්පතේ වැඩ විෂයය අංක 9.1 යටතේ පෙර සවි බංකු 10 ක් සපයා සවි කිරීම සඳහා රු.120,000 ක් ගෙවා ඇතත්, බංකු 01 ක ඌනතාවයක් පැවති බව භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය.

(ආ) පෙර සවි බංකුවක වෙළඳ පළ වටිනාකම රු.5,000 කට අඩුව පැවතියත්, එක් බංකුවක් සපයා ගොඩනැගිල්ලේ තැබීමට රු.12,000 ක් ඇස්තමේන්තු කිරීමෙන් රු.70,000 ක් පමණ අලාභයක් රජයට සිදුව ඇති බවක් නිරීක්ෂණය විය.

### 3.7.5 මොරයාය සිට ගනේවත්ත පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම - රු.881,500

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 21 දින කරන ලද භෞතික පරික්ෂාවෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) කැඩී බිඳී ගිය මාර්ග තලයේ කැඩී බිඳී ගිය ස්ථාන පිළිසකර කර ඇතත්, එක් එක් කැඩී බිඳී ගිය ස්ථාන විශේෂයෙන් 4" ගල් යෙදියයුතු ස්ථාන යනාදී වශයෙන් එම ස්ථාන හරි හතරැස් කර, මිනුම් ගෙන එකී මිනුම් වර්තා අනුව, ඇස්තමේන්තු කර නොතිබුණි.

(ආ) 4" ගල් යෙදියයුතු ස්ථාන නිශ්චිතව හඳුනා ගෙන මිනුම් ගෙන නොමැති වීම හේතුවෙන්, එම ගල් යොදා ඇති ස්ථාන පරීක්ෂා කිරිමට නොහැකි වුණි.

(ඇ) දෙවන වර තාර යෙදීම සඳහා වැඩ විෂය අංක 09 යටතේ 897.$m^2$ ක් සඳහා රු.132,064 ක් ගෙවා ඇතත්, දෙවන වර තාර ආලේපය නිසි පරිදි සිදු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 03 ක සියයට 26 සිට සියයට 92 දක්වා ද වියදම් විෂයයන් 04 ක සියයට 34 සිට සියයට 87 දක්වා ද විචලනයක් නිරීක්ෂණය විය.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.

2014 අගෝස්තු 08 දිනැති අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) කොන්ත්‍රාත් පාලනය